## සුරාපානය

මත් කොට මනුෂ්‍යයාගේ ප්‍රකෘති ස්වභාවය නැති කරන්නා වූ රා අරක්කු ආදි පාන වර්ග බීම ද, දුම්වර්ග බීම ද, කෑම වර්ග කෑම ද යන මේ සියල්ල සුරාපානකර්මයට අයත් ය. මෙය සත්ත්වයන්ගේ දෙලෝ වැඩ නසන්නා වූ මහත් අනර්ථකාරී වූ කර්මයකි. සුරාවෙන් මත් වූ කල්හි සත්ත්වයා පිස්සකු වැනි වේ. සුරාපානය නිසා ස්වකීය සිත කය දෙක හසුරුවා ගැනීමේ ශක්තිය ඔහු කෙරෙන් තුරන් වේ. එ බැවින් මත්වූයේ ජනයා මැද නො සරුප් බස් බිණීම්, ගී කීම්, නැටීම්, නග්න ව හැසිරීම් ආදිය කොට ජනයාගේ පිළිකුලට භාජන වේ. සමහර විට ක්ලාන්ත වී තැන තැන වැටෙයි. සමහර විට ගත් ආහාරය වමනය කරයි. සමහර විට දුටු දුටුවන් හා කලහයට එයි. ස්වකීය අඹු දරුවන්ට පවා නොයෙක් විට හිරිහැර කරයි. ස්වකීය භාණ්ඩ විනාශ කර ගනී,නො ලැබූ දෑ ලබා ගැනීමේ ද ලැබූ වස්තුව ආරක්ෂා කර ගැනීමේ ද ඥානය ඔහු කෙරෙන් තුරන් වේ.එ බැවින් හේ දිළින්දකු නම් දිළිඳු බවින් නැගිටින්නට නො සමත් වේ. පොහොසතකු නම් වස්තු භංගත්වයට පැමිණ දිළිඳු වේ. සුරාව අධික කොට පානය කිරීමෙන් ඇතමෙක් නොයෙක් රෝගයන්ට භාජන වී අකාලයෙහි මැරෙති. මේවා අපට පෙනෙන්නට ම ඇත්තා වූ සුරා පානයේ දෝෂයෝ ය. සුරාපානයෙන් මරණින් මතු ලැබෙන විපාක මෙසේ වදාළ සේක.

"සුරාමේරය පානං භික්ඛවෙ! ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකං හොති, පෙත්තිවිසය සංවත්තනිකං හොති, යො සබ්බලහුසො සුරාමේරය පානස්ස විපාකො මනුස්ස භූතස්ස උම්මත්තක සංවත්තනිකො හොති"

"මහණෙනි, සේවනය කරන ලද්දා වූ වඩනා ලද්දා වූ බොහෝ කොට කරන ලද්දා වූ සුරා මේරය පානය නරකයෙහි ඉපදීම පිණිස පවත්නේ වේ. තිරිසන් යෝනියෙහි ඉපදීම පිණිස පවත්නේ වේ. ප්‍රේත විෂයෙහි ඉපදීම පිණිස පවත්නේ ය. සුරාමේරය පානය කිරීමේ ඉතා ම අල්ප විපාකයාගේ වශයෙන් මිනිස් ලොව උපන්නහුට උමතු බව ඇති කරන්නේ වේ.' ය යනු එහි තේරුම යි.

"උම්මත්තා විගත ලජ්ජගුණා භවන්ති
දීනා සදා ව්‍යසන රෝග පරායනා ච,
ජාතා භවේසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලාහලවිසංච සුරා විපක්ඛා"

නුවණ නැත්තා වූ පුද්ගලයෝ හලාහල විෂයක් (කෑ සැටියේ මැරෙන විෂයක්) බඳු වූ සුරාව පානය කොට අනාගතයෙහි උම්මත්තකයෝ වන්නාහ. ලජ්ජා ගුණය නැත්තෝ වන්නාහ. දිළින්දෝ වන්නාහ. සෑම කල්හි නොයෙක් ව්‍යසන හා නොයෙක් රෝග ඇත්තෝ වන්නාහ. නොයෙක් ජාතිවල උපන්නාහු විරූප ශරීර ඇත්තෝ වන්නාහ යනු එහි තේරුමයි.

සුරාපානය නිසා මෙලොව විනාශයට පත්වූවෝ බොහෝ ය. එක් කලෙක මුළු දඹදිව ම යටපත් කර සිටීමට සමත් වූ වාසුදේවාදි රාජ කුමාරවරු දසදෙන සුරාපානයෙන් නැසුණෝ ය. පෙර එක් රජ කෙනෙක් සුරාපානයෙන් මත් වූයේ සිය පුතු මරවා ඔහුගේ මස් කා සිහි වූ පසු මහත් ශෝකයට හා ලජ්ජාවට ද පැමිණියේ ය. සතළිස් කෝටියක් ධනය ඇති ව සිට අනේපිඬු මහ සිටුහුගේ බෑනා කෙනෙක් සුරාපානය නිසා ධන හානියට පැමිණ සිඟා කමින් ජීවත් වී අන්තිමේ දී අනුන්ගේ ගෙයක බිත්තියක් අද්දර මළේය. ගෙහිමියෝ බලු කුණක් සේ මල සිරුර වනයට ඇද දැමූහ. සැවැත් නුවර අසූකෙළක් ධනයට හිමියකු ව සිටි මහා ධන සිටු පුත්‍රයා සුරාපානය නිසා සියල්ල නැති වී හිඟමනට පත්ව අන්තිමේ දී අනුන්ගේ ගෙයක බිත්තිය අද්දර මැරී ගෙහිමියන් විසින් බලු කුණක් සේ වනයට ඇද දමන ලද්දේ ය. පෙර තව්තිසා දෙව්ලොව විසූ අසුරයෝ ද සුරාපානය නිසා ඒ දෙව් ලොවට අහිමි වූහ.

**සුරාපාන කර්මය දශාකුශල කර්ම පථයට ඇතුළු වන නො වෙන හැටි.**

මෙපමණ ආදීනව රාශියක් ඇත්තා වූ සුරාපානය ද කර්මපථයක් වශයෙන් ගෙන අකුශල කර්මපථ එකොළසක් බුදු සමයේ නො දැක්වීමට හේතුව කවරේ ද යනු සැලකිය යුතු කරුණකි. කුශලාකුශලයන් ගේ විපාකය ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක වශයෙන් දෙවැදෑරුම් වේ. මරණින් මතු යම්කිසි තැනක උත්පත්තියක්

සිදු කිරීම ප්‍රතිසන්ධි විපාකය ය. උපන් සත්ත්වයා හට සැපදුක් පැමිණවීම ප්‍රවෘත්ති විපාකය ය. කර්මපථය යි කියනු ලබන්නේ ප්‍රතිසන්ධිය ගෙන දෙන්නා වූ කර්මයන්ට ය. ප්‍රතිසන්ධිය ගෙන දීමේ ඒකාන්ත බවක් නැත්තා වූ කර්මයන්ට කර්ම යන නාමය පමණක් කියනු ලැබේ. සුරාපාන කර්මය ද ප්‍රතිසන්ධි ගෙන දීම් වශයෙන් අනේකාන්තික කර්මයෙකි. සුරාපාන කර්මය ප්‍රතිසන්ධිදායක කර්මයක් වනුයේ ප්‍රාණඝාතාදි කර්මපථයන් හා සම්බන්ධ වූ කල්හිය. සුරාපානයෙන් මත්ව ප්‍රාණඝාතාදි ක්‍රියාවක් කළහොත් ඒ සුරාපාන කර්මය ප්‍රාණඝාත කර්මයාගේ පූර්ව චේතනා භාවයෙන් අපාය ප්‍රතිසන්ධි දානය කරන්නේ ය. ප්‍රාණඝාතාදි පාපයක් කොට තමාගේ වික්‍රමය ගැන සතුටු වී සුරාපානය කළ හොත් එය ඒ කර්මපථයාගේ අපර චේතනා වශයෙන් ප්‍රතිසන්ධි විපාකයක් ඇති කිරීමට සමත් වන්නේ ය. යම්කිසි පාප ක්‍රියාවක් කිරීමට ධෛර්‍ය ඇති කර ගනු පිණිස කරන සුරාපානය ද ඒ කර්මයාගේ පූර්ව චේතනා භාවයෙන් ප්‍රතිසන්ධි ගෙනදීමට සමත් වන්නේ ය. නිරෝගභාවාදි අන් කරුණක් නිසා කරන්නා වූ සුරාපානය ද සුරාපානය කොට මත් ව යම් කිසි අපරාධයක් නො කරන්නා වූ තැනැත්තාගේ සුරා පානය ද පාපයක් වන නුමුත් කර්මපථයක් නොවේ. මෙසේ සුරාපාන කර්මය ප්‍රතිසන්ධි දානයෙහි අනේකාන්තික බැවින් එය ද ඇතුළත් කොට අකුශල කර්මපථ එකොළොසක් නො ගන්නා ලැබේ.

වෙන් වූ කර්මපථයක් වශයෙන් එය නො ගන්නේ වී නමුත් **"තස්ස සභාගත්තෙන මිච්ඡාචාරෙ උපකාරකත්තෙන දසසුපි කම්මපථෙසු අනුපවෙසො"**යි එය සභාගත්වයෙන් කාමමිථ්‍යාචාර කර්මය ද, උපකාරකත්වයෙන් දශාකුශල කර්මපථයට ම ද ඇතුළත් වන බව පූර්වාචාර්යවරයෝ දැක්වූහ. එසේ දශ අකුශලයට ඇතුළත් වන බැවින් එය වෙන් වූ කර්ම පථයක් වශයෙන් නො ගන්නා ලදැයි ද කිය හැකි ය.

සුරාපාන කර්මය ප්‍රතිසන්ධි විපාකදානයෙහි අනේකාන්තික කර්මයක් නම් එහි විපාක වදාරන්නා වූ තථාගතයන් වහන්සේ "නිරය සංවත්තනිකං හොති" යනාදිය වදාළේ කුමට ද? යන ප්‍රශ්නය ද මෙහි දී ඇති වේ. සුරාපානය මදයට හේතු වේ. මදය

අකුශලයට හේතු වේ. අකුශලය අපායෝත්පත්තියට හේතු වේ. සුරාපානය නො කළේ නම් මදය නිසා සිදුවන අකුශල් සිදු වී අපායගාමී නොවන බැවින් සුරාපානය ද අපායෝත්පත්තියට දුරින් සිටින බලවත් හේතුවක් වේ. එබැවින් එහි ඵල දක්වන්නා වූ තථාගතයන් වහන්සේ ''නිරය සංවත්තනිකං හොති'' යනාදිය වදාළ සේක. අපායෝත්පත්තිය සිදු වන්නේ සුරාපාන මාත්‍රයෙන් නොව මත්ව කරන අකුශලයෙන් බව -

''යං වෙ පීත්වා දුච්චරිතං චරන්ති
කායෙන වාචාය ච චෙතසා ච
නිරයං වජන්ති දුච්චරිතං චරිත්වා
තස්ස පුණ්ණං කුම්භම්මං කිණාථ''

යන ජාතක ගාථාවෙන් ද පැහැදිලි වේ.

''යමක් පානය කොට කයින් ද වචනයෙන් ද සිතින් ද දුසිරිත්හි හැසිරෙත් ද දුසිරිත්හි හැසිර හෙවත් පව් කොට නරකයට යෙත් ද එයින් පිරුණා වූ මේ සැළිය ගනිව් ය'' යනු එහි තේරුමයි. මෙයින් දැක්වෙන්නේ සුරා බී, එ පමණින් අපායට යෑමක් නොව එය නිසා පව් කොට අපායට යෑමෙකි. සුරාපානය කොට පවක් කෙළේ හෝ වේවා නො කළේ හෝ වේවා යමෙක් බෙහෙතක් වශයෙන් වුවත් බිඳක් වත් සුරාපානය කළේ නම් එයින් සුරාපාන සිකපදය බිඳේ. එබැවින් සුරාපානය කළත් අපි පව් නො කරමු යි කියා එය සැහැල්ලු කොට සිතා සුරාපානය කරන්නට නො යා යුතු ය. පන්සිල් රක්නා බෞද්ධයාට මදක් වත් සුරා බෙහෙතක් පිණිසවත් පානය කිරීමට අවකාශයක් නැති බව තේරුම් ගෙන දෙලොව වැඩ කැමැත්තෝ සුරාව විෂයක් මෙන් සලකා එයින් වළකිත්වා!